# මාදු ගඟ තෙත්බිම ආශ්‍රිත සංචාරක කර්මාන්තයේ ඇතිවන ගැටලු සඳහා ප්‍රවර්ධනාත්මක සැලැස්මක්

ආර්.එම් ප්‍රදීපා කුමාරි*

ශ්‍රී ලංකාවේ තෙත්බිම් අතර සංචාරක ආකර්ශනය දිනූ ස්ථානයක් ලෙස මාදු ගඟ හඳුනාගත හැකිය. දැනට හඳුනාගත් දූපත් 17ක් පමණ මේ ආශ්‍රිතව ඇත. ජෛව විවිධත්වය හා දූපත් සමූහය කේන්ද්‍ර කොටගෙන මෙම තෙත් බිම ආශ්‍රිතව සංචාරක කර්මාන්තය ක්‍රියාත්මක වේ. එම සංචාරක ආකර්ශන ප්‍රදේශය තුළ හඳුනාගත් ගැටලු සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම සහ ප්‍රවර්ධනාත්මක සැලැස්මක් සෑදීම මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ විය. මාදු ගඟ ආශ්‍රිත ජනතාවගෙන් තෝරාගත් 40 දෙනෙකු යොදාගෙන ව්‍යුහගත ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීම, මෙම ස්ථානයට පැමිණෙන සංචාරකයන් 20 දෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, මෙම තෙත් බිම අයත් ප්‍රදේශයේ පෞද්ගලික හා රාජ්‍ය ආයතනයන්ගෙන්, E-library සඟරා සහ ලිපි කියවීම ආදිය තුළින් ප්‍රාථමික හා ද්විතීයික දත්ත ලබාගන්නා ලදී. යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, මාර්ගෝපදේශන සේවය විධිමත් නොවීම, බෝට්ටු ප්‍රවාහන මිල පාලනයක් නොවීම, සංචාරක සේවා සපයන ආයතනවල ප්‍රතිපත්ති විරෝධී ක්‍රියා, අනවශ්‍ය දේශපාලන මැදිහත්වීම්, අහිතකර පාරිසරික බලපෑම්, සංචාරක පහසුකම්වල දුර්වලතා, විවිධ සමාජ සංස්කෘතිකමය ගැටලු, ජෛව විවිධත්වයට හානි සිදුවීම, වැනි ගැටලු රැසක් හඳුනාගත හැකි විය. උක්ත හඳුනාගත් ගැටලු සඳහා ප්‍රවර්ධනාත්මක සැලැස්මක් සැකසීම මීලඟ පියවර විය. එම ගැටලු වළක්වා ගැනීම සඳහා මූලිකව ම මෙම තෙත් බිම ආශ්‍රිතව ඇති පෞද්ගලික සංචාරක සේවා ආයතන විධිමත් ලෙස සැකසීම, සංචාරකයාට තෙත් බිමෙහි ඇති වටිනාකම පහදා දීම, සංචාරකයාගේ මූලික අවශ්‍යතාවන් සපුරාගත හැකි ස්ථාන තෙත්බිම තුළ ස්ථාපනය කිරීම, මෝටර් බෝට්ටු වෙනුවට පරිසර හිතකාමී ප්‍රවාහන ක්‍රම හඳුන්වාදීම, සංචාරක පොලිස් මධ්‍යස්ථානයක් පිහිටුවීම ආදී සැලසුම් එහි අන්තර්ගත විය. රාජ්‍යමය වශයෙන් හා පෞද්ගලික අංශයේ මැදිහත්වීම විධිමත් ලෙස ළඟාකරගැනීම, තෙත් බිම තුළ සංචාරක කර්මාන්තය ආශ්‍රිතව දැනට ක්‍රියාත්මක වන අනවශ්‍ය දේශපාලන මැදිහත්වීම පාලනය කිරීම සහ රාජ්‍ය අංශයේ බලධාරීන්ගේ අවධානය යොමුකිරීම, ප්‍රාදේශීය ප්‍රජා සංවිධාන බලාත්මක කිරීම, ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා දේශීය නීතිරීති හා අන්තර්ජාතික ප්‍රතිපත්ති හඳුන්වාදීම, සංචාරක සේවා සපයන තැනැත්තන් සඳහා මනා පුහුණු වැඩසටහන් පැවැත්වීම ආදී යෝජනාවන් අවසන් වශයෙන් මෙම අධ්‍යයනයෙන් ඉදිරිපත් කරන ලදී.

ප්‍රමුඛ පදඃ- තෙත් බිම, මාදු ගඟ, සංචාරක කර්මාන්තය, ගැටලු,

* Pkrathnayaka91@gmail.com